www.agaram.lk

# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2019
## First Term Test - 2019

සිංහල භාෂාව හා සාහිත්‍යය - I, II
Sinhala Language & Lit - I, II

කාලය පැය 2යි.

නම :- .............................................. විභාග අංකය :-

9 ශ්‍රේණිය

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) නූතන සිංහල වර්ණමාලාවට අයත් ස්වර ගණන.
(i) 20 කි. (ii) 18 කි. (iii) 60කි. (iv) 30කි.

(02) කණ්ඨජ අකුරු පමණක් ලැබෙන වචනය තෝරන්න.
(i) කළුතර (ii) කතරගම (iii) කටුගොඩ (iv) කාක්කා

(03) විරුද්ධාර්ථවත් යුගල පදය ඇතුළත් වරණය වනුයේ,
(i) යාම් ඊම් (ii) ලියුම් කියුම් (iii) හැඩිලි දෙඩිලි (iv) සිතුම් පැතුම්

- නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වරණය තෝරන්න.

(04) (i) මර්ධනය (ii) මර්දනය (iii) මර්දණය (iv) මර්ධනය

(05) (i) ධර්මිෂ්ට (ii) දර්මිෂ්ඨ (iii) ධර්මිශ්ට (iv) ධර්මිෂ්ඨ

- හිස්තැනට සුදුසු වචනය තෝරා දී ඇති ප්‍රස්තාපිරුළ සම්පූර්ණ කරන්න.

(06) කණ කොකාගේ .................... පේන්නේ ඉගිලෙන විටලු
(i) පිහාටු (ii) ඇස් (iii) සුදු (iv) කළු

- ඉරි ඇඳි පදයට වඩාත් ගැළපෙන පිළිතුර වනුයේ,

(07) සමාජ විරෝධී කටයුතු සඳහා <u>උල්පන්දම් දීම</u> නොමනා ක්‍රියාවකි.
(i) උපදෙස් දීම (ii) සහය දීම (iii) සවන් දීම (iv) අනුබල දීම

(08) <u>අහස් මාලිගා</u> තැනීම දියුණුවට අහිතකරය
(i) නොලැබෙන දේ ගැන සිහින මැවීම.
(ii) අහසේ මාලිගා තැනීමට හැකි බව.
(iii) අනුන්ගෙන් උදව් ඉල්ලා සිටීම.
(iv) අහසේ මාලිගා තැනීම සිහිනයක් බව.

- මුලින් දී ඇති පදයේ විරුද්ධාර්ථවත් පදය තෝරන්න.

(09) බහුශ්‍රැත (i) නිපන (ii) ජනශ්‍රැති (iii) අල්පශ්‍රැත (iv) ප්‍රවීන
(10) මුග්ධ (i) විදග්ධ (ii) මෝඩ (iii) අඩඟු (iv) උපායශීලී

- මුලින් දී ඇති පදයට සමානාර්ථ පදය තෝරන්න.

(11) ප්‍රභාතය (i) ප්‍රභාෂ්වර (ii) උදෑසන (iii) බැවුම (iv) රාත්‍රිය
(12) අරවින්ද (i) ඉද්දමල (ii) පිච්චමල (iii) නෙළුම් මල (iv) ඕලු මල

(අනෙක් පිටුව බලන්න.)


agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

(13) යුගල පදයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

(i) අටුකොටු, අඟහිඟ, අනම්මනම්, අතන මෙතන

(ii) ඉවුම් පිහුම්, ඉහනිකට, ඉවක් බවක්, ඉඩම් කඩම්

(iii) වගතුග, වන්න හුන්න, වතුපිටි, වසවිස

(iv) කසිලි බිසිලි, කඩ වීදිය, කඩිමුඩි, කයි කතන්දර

(14) ඉරි ඇඳි පදය අයත්වනුයේ කවර ව්‍යාකරණ ගණයකටද?

ඇය ගැයූ ගී සුමිහිරිය

(i) නිපාතයකි. (ii) ක්‍රියාපදයකි. (iii) උපසර්ග පදයකි. (iv) නාම පදයකි.

- හිස්තැනට සුදුසු පදය තෝරන්න.

(15) කුරුල්ලෝ අහසේ පියාසර ...................................

(i) කරයි. (ii) කරති. (iii) කළේය. (iv) කරන්නීය.

(16) පනීභාරතී මහතා දේශීය නර්තනයට විශාල සේවාවක් සිදු .............................

(i) කළේය (ii) කරන්නීය (iii) කළහ. (iv) කරති

(17) අයෙක් සතුටු සාමීචියේ යෙදී .........................

(i) සිටියේය (ii) සිටින්නීය (iii) සිටියි (iv) සිටිති

- දී ඇති අදහසට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(18) සිත් ඇදගන්නා සුළු

(i) චිත්තාකර්ෂණීය (ii) සිතක මහිම

(iii) සිතට දැනෙන නිදහස (iv) සිතෙහි වෙනස්වන බව

(19) රනින් කරන ලද

(i) රජතමය (ii) ස්වර්ණමය (iii) රිදීමය (iv) ශෛලමය

(20) තම දේශය පිළිබඳ ඇති අභිමානය

(i) භක්තිය (ii) ආදරය (iii) දේශාභිමානය (iv) ගෞරවය

(ලකුණු 2 x 20 = 40)

(අනෙක් පිටුව බලන්න.)



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

## II කොටස

- සියලුම ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

**(01)** පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. මනමේ නාට්‍යයේ සඳහන් ප්‍රධාන චරිත දෙකක් නම් කරන්න.
ii. කොග්ගල මහා ප්‍රාඥයා යන නමින් හඳුන්වනු ලැබුවේ කවුරුන්ද?
iii. කෝට්ටේ යුගයේ රචිත උපදේශ කාව්‍යයක් නම් කරන්න.
iv. මනමේ නාට්‍ය රචනා කරනු ලැබුවේ කිනම් ජාතක කථාවක් පදනම් කරගෙනද?

(ලකුණු 5 x 2 = 10)

**(02)** දී ඇති මාතෘකා අතුරින් එකක් තෝරාගෙන රචනාවක් ලියන්න.

i. පරිසරය සුරකිමු.
ii. කසළ හිසරදයක් නොව සල්ලි මවන නිධානයකි.
iii. අපේ ආහාර අපේ සවියෙන්
iv. මාර්ග අනතුරු වළකාගනිමු.

(ලකුණු 20)

**(03)** 9 ශ්‍රේණියේ සිසුන් සඳහා සංවිධානය කරන ලද අධ්‍යාපන චාරිකා සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ නිසි අවසර ලබාගත යුතුව ඇත. මෙම චාරිකාවේ ප්‍රධාන සංවිධායක ඔබ යයි සිතා අවසර ඉල්ලීමේ එම ලිපිය ඔබ විසින් සකස් කරන්න.

(ලකුණු 15)

**(04)** පහත ප්‍රකාශ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

"මට වන්දනා කරන්න බැරිවුයේ ශ්‍රී පාදය පමණයි."

**i.** ඉහත ප්‍රකාශය කරනු ලැබුවේ කවුරුන්ද?
**ii.** ඉහත ප්‍රකාශය සිදු කිරීමට ඉවහල් වූ අවස්ථාව කෙටියෙන් ලියන්න.
**iii.** එම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවුරුන්ද?
**iv.** මෙම කථාව උපුටාගනු ලැබුවේ කිනම් කෘතියකින්ද?
**v.** ඔබ දන්නා වෙනත් ජාතක කතාවක් නම් කරන්න.

(ලකුණු 05)

**(05)** සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න.

**i.** මුළු රාත්‍රියම ................................ තුළ නිදිවර්ජිත ව රැඳී සිටින ගොවියා .......................... ගොයම සතුන්ගෙන් ආරක්ෂා කරයි. (පැළ/ වල)
**ii.** මග සලකුණු නොදැන .....................ට ගිය පිරිස බොරු................. ක වැටී අනතුරට පත්වූහ. (වල/වළ)
**iii.** සැදැහැවත් ................ භික්ෂූන් වහන්සේට ...................... නමා වැන්දෝය. (දණ/දන)
**iv.** .................... අලියාගේ එක් කකුළක් .................... වී ඇති අයුරු වෛද්‍යවරයාගේ අවධානයට ලක්විය. (වන / වණ)
**v.** ......................... ආරාධිත අමුත්තා ත්‍යාග .......................යට සහභාගී විය. (ප්‍රධාන/ ප්‍රදාන)

(ලකුණු 2 x 5 = 10)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk


agaram.lk